IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2016/2017

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2019 ජුනි)

## BLE 207 (a) - වාණිජ නීතිය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අට (08) කින් සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(2) ඕනෑම ප්‍රශ්න පහ (05) කට පමණක් පිළිතුරු සැපයිය යුතු වේ.

(3) පිළිතුරු සැපයීමේදී නඩු තීන්දු සහ ව්‍යවස්ථා පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ.

(4) අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.

(5) කාලය පැය තුනයි. (03)

(6) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(7) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. ‘සෑම ගිවිසුමක්ම එකඟතාවයක් වන නමුත් සෑම එකඟතාවයක්ම ගිවිසුමනක් නොවේ.’ ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? ගිවිසුමක් සංස්ථාපන වීමට අවශ්‍යය සංඝටක ඇසුරෙන් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 20)

02. ගිවිසුමක නියම එහි ප්‍රධාන අන්තර්ගතය තීරණය කෙරෙන තීරණාත්මක සාධක වේ. පහත සඳහන් නියම පිළිබඳව සැකෙවින් විස්තර කරන්න.

(අ) කොන්දේසි

(ආ) ප්‍රතිඥා භාර

(ඇ) වගකීමෙන් මුක්ත වීමේ වගන්ති

(ඈ) ඉනොනිවේට් නියම

(ලකුණු 20)

03. ගිවිසුමක් අසාර්ථක වීමට / නිෂ්ප්‍රභ කිරීමට (Vitiate) බලපාන සාධක කිහිපයකි. එකී සාධක අතුරින් වැරදීම හා අවනිදේශනය යන්න ගිවිසුමක් නිෂ්ප්‍රභ කිරීමට බලපාන අයුරු විමසන්න.

(ලකුණු 20)

04. භාණ්ඩ විකිණීමේ නීතියේ මූලික අරමුණ වන්නේ පාරිභෝගිකයා ආරක්ෂා කිරීමයි. මේ අනුව භාණ්ඩ විකිණීමේ නීතියෙහි “කේවියට් එම්ප්ටර්” එනම් “ගැණුම්කරු ප්‍රවේශම් වන්න” යන මූලික සංකල්පය හඳුනාගැනේ. එසේවුවද මෙකී සංකල්පයට යම් යම් ව්‍යතිරේඛද හඳුන්වා දී ඇත.
1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ප්‍රතිපාදන හා විනිශ්චිත නඩු තීන්දු ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න.

(ලකුණු 20)

05. (අ) 1896 අංක 11 දරණ භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ ඇති ආරක්ෂණයන් ලබා ගැනීම සඳහා, පාරිභෝගිකයෙකු ඇති කරගනු ලබන ගිවිසුමක් “භාණ්ඩ” සම්බන්ධ ගිවිසුමක් විය යුතුය.
භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ “භාණ්ඩ” යන්න නිර්වචනය කරන්න. නඩු තීන්දු නීතිය මඟින් ඔබේ පිළිතුර තවදුරටත් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) භාණ්ඩ විකිණීමේ ආඥා පනත යටතේ මිල නොලත් විකුණුම් කරුවෙකු යන්න හඳුන්වා ඔහු සතුව පවතින අයිතීන් කවරේද යන්න විමසන්න.

(ලකුණු 10)

06. රේඛණය කරන ලද චෙක් පත්‍රයක් සම්බන්ධයෙන්, එක්රැස්කරන බැංකුවක් හා ගෙවීම් කරන බැංකුවක් සතු යුතුකම් හා වගකීම් කවරේද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

07. නියෝජ්‍යත්ව සම්බන්ධතාවක් විවිධ ආකාරවලින් ඇතිවිය හැකිය. නියෝජ්‍යත්ව සම්බන්ධතාවයක් ඇතිවිය හැකි විවිධ අයුරු විමසන්න.

(ලකුණු 20)

08. (අ) නියෝජිතයෙකු සිය ප්‍රධානියා සමඟ කටයුතු කරන විට, ඔවුනොවුන්ගේ අයිතීන් අතර ගැටීමක් ඇති නොවන අයුරින් කටයුතු කළ යුතු බව දැක්වේ.
නියෝජිතයා සහ ප්‍රධානියාගේ අයිතීන් අතර ගැටීමක් ඇති නොවන ලෙසට කටයුතු කිරීමේ ඔවුනවුන්ගේ වගකීම් පිළිබඳව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(ආ) ගනුදෙනු කළ හැකි සාධක පත්‍ර, 'nemo dat quod non habet' රීතියට ව්‍යතිරේඛයක් සපයයි. පැහැදිලි කරන්න.

(ලකුණු 10)

****************************************